# මැතිවරණ දෙපාර්තමේන්තුව
## தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல் : 011-2868426

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)


මගේ අංකය : PE/2015/TR-01 எனது இல.
ඔබේ අංකය : உமது இல.
දිනය : 2015.07.10 திகதி

චක්‍රලේඛ අංක TR/2015/07

**සියළුම තේරීම්භාර නිලධාරි / දිස්ත්‍රික් ලේකම්,**
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17**
**ඡන්ද පොළ ප්‍රවාහන පහසුකම් සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ යොදා ගැනීම.**

**2015.08.17** දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සළසා ගැනීම පිණිස ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ යොදා ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

02. මෙම බස්රථ ලබාදිය හැකි මිළ ගණන්, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් මා වෙත දන්වා ඇති අතර, එය පහත පරිදි වේ. (අදාළ ලිපියේ පිටපතක් ද අමුණා ඇත.) ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ඩිපෝ කළමනාකරුවන් සමග සාකච්ඡා කර ඔබට අවශ්‍ය බස්රථ ප්‍රමාණය කල්වේලා ඇතිව වෙන්කරවා ගන්න.

| | පැය 12 අඩු කාලය සඳහා මුදා හරින බස්රථ | පැය 12 වැඩි කාලය සඳහා මුදා හරින බස්රථ |
|---|---|---|
| ආසන 42 හෝ ඊට වැඩි බස් රථ සඳහා | රු.11,000.00 | රු.12,200.00 |
| ආසන 32 හෝ ඊට අඩු බස්රථ සඳහා | රු.8,300.00 | රු.9,500.00 |
| උපරිම කි.මී.ගණන | රු.100.00 | රු.125.00 |
| උපරිම කි.මී.ගණන ඉක්මවූ විට කි.මී.1 ක් සඳහා | රු.80.00 | රු.80.00 |
| පැය 24 ක කාලයක් ඉක්මවූ විට ගාස්තුව පැයකට | - | රු.400.00 |

03. මේ අනුව ඔබ විසින් යොදා ගැනීමට අපේක්ෂිත ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ ප්‍රමාණය කොපමණ ද යන්න, සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත ද ලිඛිතව දන්වන්නේ නම් මැනවි. ඡන්ද විමසීම අවසන්වීමෙන් අනතුරුව මෙම චක්‍රලේඛයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් යටතේ ඔබ විසින් ලබාගත් බස්රථ සඳහා ගෙවීම් කිරීමට ද කරුණාකර කටයුතු කරන්න.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්

පිටපත් : 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) – දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට අවශ්‍ය බස්රථ ප්‍රමාණය ලබා ගැනීම සඳහා සියළුම දිස්ත්‍රික්කයන්හි ඩිපෝ කළමනාකරුවන් (ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය) දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

2. විගණකාධිපති
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
4. ප්‍රධාන ගණකාධිකාරී
5. ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන)
6. ගණකාධිකාරී (ගෙවීම්)


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011 2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
e-mail : comelesl@sltnet.lk

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
e-mail : admin@slelections.gov.lk

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
e-mail : info@slelections.gov.lk


E:\පාර්ලිමේන්තු මැතිවරණය - 2015\Transport Ciculars - 2015\TR-2015-07.doc